www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 2004 මැතිවරනයෙන් පසුව: දේශපාලන සහ සමාජ අර්බුදය උත්සන්න වනු ඇත

**After the 2004 elections: the political and social crisis will intensify**

**ලෝක සමාජවාදී වෙබ් අඩවියේ**
**කර්තෘ මන්ඩල ප්‍රකාශය**
**2004 නොවැම්බර් 3**

විවෘත ආගමික ආයාචනා මත පදනම් වෙමින් ආක්‍රමනශීලී ක්‍රිස්තියානි ඡන්ද බලමුලු ගැන්වීම හරහා බොහෝ සෙයින් සාක්ෂාත් කර ගැනුනු ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ්ගේ යලි තේරී පත් වීම ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් දුර දිග යන හා ව්‍යසනකාරී ප්‍රතිවිපාක ගෙන එනු ඇත.

සෙනෙට් සභික ජෝන් කෙරී පරාජය පිලිගනිමින් සිදු කල ආකෘතික කතාවේ දී ඉදිරිපත් කල නිස්සාර හා මිනිසුන් නිද්‍රාගත කරන ප්‍රකාශ කෙසේ වෙතත්, 2004 මැතිවරන ප්‍රතිඵල ජාතික එකමුතුව යලි ඉපදීමකට තුඩු දෙනු නැත. 2004 මැතිවරනය නියෝජනය කරන්නේ ඇමරිකානු දේශපාලන පද්ධතියෙහි බාදනයේ හා අර්බුදයේ වැඩි දුර අවධියකි. එය වනාහි පසුගිය දශක තුනක කාලය මුලුල්ලේ රිපබ්ලිකන් පක්ෂය වර්ධනය කල මූලෝපාය වන, සමාජ ප්‍රතිගාමිත්වය හා මිලිටරිවාදය සඳහා මහජන පදනමක් නිර්මානය කර ගනු පිනිස ආගමික මූලධර්මවාදීන් පෝෂනය කිරීමේ මූලෝපායේ කුලුගැන්වීම යි. සංගත හා මූල්‍ය කතිපයාධිකත්වය තමන්ගේ ම ෆ්‍රැන්කන්ස්ටයින් මෘගයා හැඩ ගස්වා ඇත. එය වනාහි එක්සත් ජනපදයේ අනාගමික ව්‍යවස්ථාමය පදනම් ද සම්ප්‍රදායික ප්‍රජාතන්ත්‍ර රීතීන් පවත්වා ගෙන යාම ද සමග නො පෑහෙන දේශපාලන හා සමාජ න්‍යාය පත්‍රයක් සහිත බලවේගයකි.

බුෂ් සහ රිපබ්ලිකන්වරු බේගල් හා දේශපාලනික අවලාද යොදා ගනිමින් ද ඡන්දදායකයන්ගේ ප්‍රධාන කොටස් තුල භීතීන්, අනාරක්ෂිත හැඟීම් හා ව්‍යාකුලත්වය ගසා කමින් ද ගැඹුරින් ම ප්‍රතිගාමී උද්ඝෝෂනයක් ගෙන ගියේ ය. එහෙත් දැනට බලයේ සිටින පාර්ශ්වය වීමේ ද හිතපක්ෂපාතී මාධ්‍යවල ද 9/11 ඛේදවාචකය නිමක් නැතිව ගසාකෑමේ ද වාසිය තිබිය දී පවා, බුෂ් සමත් වූයේ මහජන ඡන්දයෙන් යන්තම් සියයට 51ක බහුතරයක් ලබා ගැනීමට පමනි.

මාධ්‍ය පන්ඩිතයන් මොනවා කීව ද මැතිවරනය බුෂ් පරිපාලනය සහ එහි පිලිවෙත් පිලිබඳ මහජන අනුමැතිය ප්‍රකාශ වීමක් නම් නො වේ. ඓතිහාසිකව ගත් කල, යලි තේරී පත් වීමට සමත් වූ ජනාධිපතිවරුන්ට තීරනාත්මක ජයග්‍රහන ලබා ගනු පිනිස තමන් බලයේ සිටීමේ වාසිය යොදා ගැනීමට හැකිවී තිබේ. 1930 ගනන්වල දී රූස්වෙල්ට්, 1960 ගනන්වල දී ජොන්සන්, 1980 ගනන්වල දී රේගන් සහ 1996 දී ක්ලින්ටන් පවා එවන් ජයග්‍රහන ලබා ගැනීමට සමත් විය. එහෙත් බුෂ්ට ලබා ගත හැකි වූයේ සරල බහුතරයකට වඩා සුලු ඡන්ද ප්‍රමානයකි.

මැතිවරන සිතියම දෙස බැලු කල වහා ම පැහැදිලි වන කරුන නම්, 2000 මතභේදයට ලක් වූ මැතිවරනයෙන් වසර හතරකට පසුව ජනගහනයේ මොන යම් හෝ සැලකිය යුතු මධ්‍යස්ථානයක් තමන්ගේ පැත්තට ඇද ගැනීමට රිපබ්ලිකන්වරු සමත්ව නැති බව යි. නැගෙනහිර හා බටහිර වෙරල බඩ ද මධ්‍යම බටහිර ප්‍රදේශවල ද වඩාත් ම කාර්මීකරනය වූ හා නාගරීකරනය වූ ප්‍රාන්ත ඇතුලු 2000 දී ගෝර් ජයගත් ප්‍රාන්ත -- කිහිපයක් හැරුනු කොට -- 2004 දී කෙරීට ගොස් තිබේ. වෙනත් වචනවලින් කිය තොත්, භීතීන් ඇවිස්සීම, බේගල්, හා තම දේශපාලන ප්‍රතිගාමිත්වයේ මෙවලම් මල්ලෙන් සොයා ගැනෙන අන් සියලු උපක්‍රම සීමාව ඉක්මවා යොදා ගත්තේ වී නමුදු, රිපබ්ලිකන්වරු සමාජීයව හා භූමි ප්‍රදේශ ඔස්සේ සිය පදනම පුලුල් කර ගැනීමෙහි ලා ඔවුන්ට පවත්නා හැකියාවේ සීමාවක් කරා ලඟා වී ඇත.

මැතිවරන සිතියම ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදයේ අර්බුදයෙහි තවත් අංශයක් පෙන්නුම් කරයි. එනම් එක්සත් ජනපද දේශපාලනයේ බෝල්කනීකරනය යි. ප්‍රධාන පක්ෂ දෙකෙන් එකක් වත් ජාතික පක්ෂ ලෙස ඇත්තට ම හැඳින්විය නො හැකි ය.

මැතිවරනය මගින් යලිත් එලිමහනට ගෙන එන්නේ ආන්තිකව ධ්‍රැවාන්තගත වූ රටකි, බුෂ්ට හා ඉරාක යුද්ධයට එරෙහි පුලුල් හා ගැඹුරින් ම දැනෙන විරුද්ධත්වයකි. ඡන්දය දුන් මුලු සංඛ්‍යාව තියුනු ලෙස ඉහල යාම සහ විශේෂයෙන් ම තරුන ජනයාගේ ඡන්දවල වේගවත් නැග්ම -- ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ඡන්දය දුන්නේ බුෂ්ට හා යුද්ධයට විරුද්ධ ව ය -- පිලිබිඹු කලේ රිපබ්ලිකන් දක්ෂිනාංශයට එරෙහිව දැවැන්ත සමාජ විරුද්ධත්වයක් පවත්නා බව ය.

එහෙත් රිපබ්ලිකන්වරු සෙනෙට් සභාව තුල සිය බහුතරය ඉහල දමා ගන්නා තතු යටතේ, මැතිවරන ප්‍රතිඵල මගින් කෙරෙනු ඇත්තේ අන්ත දක්ෂිනාංශය අත දේශපාලන බලය තව දුරටත් සංකේන්ද්‍රනය වීම

ය. ඔවුහු ආන්ඩුවේ අංශ තුන ම -- විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරනය -- පාලනය කරනු ඇත. ශ්‍රේෂ්ඨාධිකරනයට නව පත් කිරීම් මාලාවක් ම සිදු කරනු පිනිස වේදිකාව සැකසී ඇති අතර එය අධිකරනයේ අක්ෂය තව දුරටත් දකුනට තල්ලු කොට ගබ්සා අයිතීන් පිලිබඳ වේඩ්ට එදිරිව රෝ නඩු තීන්දුව ආපසු හැරවීමටත් එමෙන් ම වඩා දුර දිග යන ස්වභාවයේ තවත් ප්‍රජාතන්ත්‍ර විරෝධී නඩු තීන්දු ප්‍රකාශයට පත් කිරීමටත් තුඩු දෙනු ඇත.

මැතිවරනය බුෂ්ගේ ජයග්‍රහනයක් වනවාට වඩා ඩිමොක්‍රැටික් පක්ෂයේ දැවැන්ත ඓතිහාසික පරාජයකි. ධනවතුන් සඳහා ලබා දුන් දැවැන්ත බදු සහන ද සමග මහජන වෛරයට ලක් වූ යුද්ධයක්, දැවැන්ත රැකියා කප්පාදු, ජීවන මට්ටම් පහල වැටීම, වැඩෙන දරිද්‍රතාව සහ සංගත දූෂන සෝලි මාලාවක් මධ්‍යයේ, ප්‍රජාතන්ත්‍ර විරෝධී විධි ක්‍රම මගින් පිහිටුවන ලද සහ ජනගහනයේ හරි අඩක් විසින් නීති විරෝධී තන්ත්‍රයක් ලෙස දකිනු ලබන සහ එබැවින් විෂසෝර බේගල් මාලාවක් තුල ගිලී පැවති ආන්ඩුවක් බලයෙන් පහ කිරීමට තමන් අසමත් බව ඩිමොක්‍රැටික්වරු ඔප්පු කර ඇත. බුෂ්ට එරෙහි මහජන විරුද්ධත්වය තිබිය දී ම, සිය සමාජ සහයෝගී පදනම් පුලුල් කර ගැනීමටත් කම්කරු පන්තික ඡන්දදායකයන් අතරට බැරෑරුම් ආකාරයෙන් විනිවිදීමටත් කෙරී සහ ඔහුගේ පක්ෂය අසමත් විය.

යුද්ධයට සහයෝගය දෙන අතර ම යුද විරෝධී මනෝගතීන්ට ආයාචනා කරමින් ද දැඩි මූල්‍ය පිලිවෙත් ක්‍රියාවට දැමීමට පොරොන්දු වන අතර ම වැඩ කරන ජනතාවගේ ආර්ථික උත්සුකතාවන්ට ආයාචනා කරමින් ද "ත්‍රස්ත විරෝධී යුද්ධය" වෙනුවෙන් වඩා බලගතු පොලිස්-රාජ්‍ය බලතල ඉල්ලා සිටින අතර ම දේශප්‍රේමී පනත විවේචනය කරමින් ද කුහක සහ දෙබිඩි උද්ඝෝෂනයක පදනම මත මැතිවරන ව්‍යාපාරය ගෙන ගිය කෙරී සහ ඔහුගේ පක්ෂය භීතීන්, අගතීන් සහ දේශපාලනික අවමංගත වීම ගසාකෑමේ රිපබ්ලිකන් මූලෝපායට සඵල ලෙස අභියෝග කිරීමෙහි ලා අපොහොසත් විය.

රිපබ්ලිකන්වරුන්ට සංසක්ත මැතිවරන මූලෝපායක් පවතී. ඔවුහු ක්‍රිස්තියානි මූලධර්මවාදයට අනුග්‍රහය දක්වීම ද සම-ලිංගික විවාහ, ගබ්සා සහ පාසල් තුල ආගමික යාඥා මෙහෙයන් යනාදි ඊනියා "අපසාරී" ගැටලු යොදා ගැනීම ද මගින් සමාජ ප්‍රතිගාමිත්වය සහ මිලිටරිවාදය සඳහා මහජන පදනමක් නිර්මානය කර ගැනීමට උත්සාහ දරති.

ඩිමොක්‍රැටික් පක්ෂය වෙලා ගෙන ඇති ප්‍රතිවිරෝධතා සඵල ලෙස ගසාකෑමට ඔවුහු සමත් වූහ. නිදසුනක් ලෙස, තම විරුද්ධවාදියා දැන් "වැරදි අවස්ථාවක, වැරදි ස්ථානයක දියත් කල, වැරදි යුද්ධයක්" ලෙස විවේචනය කරන්නේ කෙරී සහ ඔහුගේ මැතිවරන සගයා වන ජෝන් එඩ්වඩ් යන දෙදෙනා ම ඡන්දය දී අනුමත කල යුද්ධයක් ය යනුවෙන් බුෂ් මතු කල මූලික කාරනාවට පිලිතුරු දීමට කෙරී කිසි දාක සමත් වූයේ නැත. සත්තකින් ම, කෙරීගේ ප්‍රතිචාරය වූයේ දැනට බලයේ සිටින "අන දෙන නිලධාරියාට" වඩා කාර්යක්ෂම ලෙස ඉරාකයේ යුද්ධය ද අනාගත යුද්ධ ද ගෙන යාමට තමන් ක්‍රියා කරන බව නිමක් නැතිව පුනරුච්චාරනය කිරීම ය.

කෙරීගේ ඊනියා "පිලි-පොල" ගලා එන්නේ දේශීයව හා විදේශීයව ඇමරිකානු පාලක ප්‍රභූව සහ එහි අවශ්‍යතා ආරක්ෂා කරන අතර ම වැඩ කරන ජනයා වෙනුවෙන් කතා කරන බව කියා පාන පක්ෂයක ප්‍රතිවිරෝධතා තුලිනි.

මිචිගන්, විස්කොන්සින් සහ මිනසෝටා වැනි අතිශයින් ම කාර්මීකරනය වූ හා නාගරීකරනය වූ මධ්‍යම බටහිර ප්‍රාන්ත තුල බහුතරයක් දිනා ගැනීමට කෙරී සමත් වූයේ යන්තමිනි. දකුනේ, ටෙනසි හා මිසෝරි වැනි දේශ සීමා ප්‍රාන්තවල සහ ගල් අඟුරුවලින් ගහන බටහිර වර්ජිනියාව වැනි පැරනි ඩිමොක්‍රැටික් කඳවුරුවල දශ ලක්ෂ සංඛ්‍යාත සුදු කම්කරුවන්ට සහ නාගරික හා ග්‍රාමීය දුගීන්ට ආයාචනා කිරීමට ඔහු උත්සුක වූයේ නැති තරම් ය.

වැඩ කරන ජනතාවගේ පන්ති අවශ්‍යතාවන්ට එල්ල කෙරුනු මොන යම් හෝ ස්ථිරසාර හා විශ්වාසනීය ආයාචනයක් නො තිබූ තතු යටතේ ආගමික පසුගාමිත්වය හා ව්‍යාකුලත්වය ගසාකෑමේ රිපබ්ලිකන් මූලෝපාය අතිශයින් ම සඵල බව ඔප්පු විය. ඩිමොක්‍රැටික් පක්ෂය කම්කරු පන්තියේ සැබෑ සමාජ හා ආර්ථික අවශ්‍යතාවන්ට බැරෑරුම් හා සෘජු ආයාචනයක් නො කරනු ඇත. එමෙන් ම එසේ කිරීමට එය අසමත් ය. ඒ එය ඇමරිකානු ධනවාදයේ පක්ෂයක් වන හෙයින් සහ එක්සත් ජනපද මූල්‍ය කතිපයාධිකත්වයට වගකිව යුතු බැවිනි. ඩිමොක්‍රැටික් පක්ෂයට මිනිස් බලය, දුරකතන හරහා ප්‍රචාර ආදිය සපයන වෘත්තීය සමිති, කම්කරු පන්තිය බලමුලු ගැන්වීම සම්බන්ධයෙන් සැලකූ කල මුලුමනින් ම බෙලහීන ය.

මෙහි ප්‍රතිඵලයක් ලෙස, කෝටි සංඛ්‍යාත වැඩ කරන ජනයා -- වඩාත් ම තියුනු ලෙස දකුනේ, මධ්‍යම තැනිතලා ප්‍රදේශවල සහ නිරිතදිග ඊනියා රතු ප්‍රාන්තවල -- තමන්ගේ ම ජීවන මට්ටම් මත ව්‍යසනකාරී ප්‍රතිවිපාක නිර්මානය කර ඇති ආර්ථික පිලිවෙත් ක්‍රියාවට දැමූ ජනාධිපතිවරයකුට ඡන්දය දුනි. එහෙත් මෙම විෂමතාව නිකම්ම අහසින් කඩා පාත් වූ එකක් නොවේ. ඩිමොක්‍රැටික් පක්ෂය සහ වෘත්තීය සමිති නිලධරය තුල සිටින ඔවුන්ගේ දක්ෂිනාංශික සගයන් විසින් අතහැර දමනු ලැබ ඇති කම්කරු පන්තියේ විශාල කොටස් අතරට විනිවිදීමට රිපබ්ලිකන්වරු සමත්ව ඇත.

1980 ගනන්වල හා 1990 ගනන්වල වෘත්තීය සමිති බිඳීමේ හා වැටුප් කප්පාදු කිරීමේ ප්‍රහාරවලට එරෙහිව පැන නැගි අරගල මාලාවක් ම පාවාදීම මගින් ක්‍රියාවට දැමීම පහසු කලා වූ කම්හල් වසා දැමීම් සහ වැටුප් කප්පාදු මගින් ව්‍යසනයට ලක් කෙරුනු ආකර කම්කරු ප්‍රජාවන් වෙසෙන හිටපු ඩිමොක්‍රැටික් බල කඳවුරු වන බටහිර වර්ජිනියාව සහ කෙන්ටකී ප්‍රාන්ත ද බුෂ්ගේ රතු ප්‍රාන්තවලට ඇතුලත් ය. ඔහයියෝ, මිසෝරි,

ඇරිසෝනා, ඇලබාමා සහ රිපබ්ලිකන්වරුන්ගේ පාර්ශ්වයට ගිය තවත් බොහෝ ප්‍රාන්ත සම්බන්ධයෙන් ද කිව හැක්කේ ඊට සමාන කතා ය. මේ සෑම ප්‍රාන්තයක දී ම, කම්කරුවන් හුදකලා කොට ඔවුන්ගේ ප්‍රතිරෝධය තලා දමනු පිනිස ඩිමොක්‍රැටික් පක්ෂය ඒඑෆ්එල්-සීඅයිඕ සමිති නිලධරය සමග සහයෝගීව ක්‍රියා කලේ ය. නිරතුරුවම සිදු වන පරිදි, එවන් පරාජයන්ගේ උරුමය වන්නේ ආර්ථික ව්‍යසනය, අපේක්ෂා භංගත්වය සහ ඉදිරිදර්ශනයක් අහිමි වීම යි. එය වනාහි ආගමික විශ්වාසය ලෙස හැඩ ගන්වා ඇති ප්‍රතිගාමී දේශපාලන පිලිවෙත් ප්‍රචාරය කිරීම පිනිස සරු පසකි.

රිපබ්ලිකන් ඡන්දදායකත්වයෙන් සැලකිය යුතු කොටසක් වර්ගවාදය සහ වෙනත් ප්‍රතිගාමී මනෝගතීන් මගින් මෙහෙයවුනු බවට සැකයක් නැත. එහෙත් සැලකිය යුතු කොටසක් රිපබ්ලිකන්වරුන්ට ඡන්දය දෙන්නේ කිසිදු ප්‍රධාන පක්ෂයක් ඔවුන්ගේ පන්ති අවශ්‍යතා වෙනුවෙන් කතා නො කරන නිසා ය.

රිපබ්ලිකන් පක්ෂයේ දකුනට පෑදීම දිග් ගැසුනු ක්‍රියාදාමයක් වී ඇත්තේ යම් සේ ද ඩිමොක්‍රැටික් පක්ෂයේ බිඳ වැටීම ද එමෙන් ම දීර්ඝ පරිනාමයක ප්‍රතිඵලයකි. පරම්පරාවකට වැඩි කාලයක් තිස්සේ, ඩිමොක්‍රැටික් පක්ෂය, සංගත කව තුල සැකයට ලක් වෙතැයි සැලකිය හැකි මොන යම් හෝ පිලිවෙත් වෙතින් දුරස්ථ භාවයක් පවත්වා ගෙන විත් ඇත. එහි දක්ෂිනාංශික ගමන සලකුනු කෙරී ඇත්තේ, කෙරී සිය මැතිවරන ව්‍යාපාරයේ දී දිගට ම පවත්වා ගෙන ගිය අංගයක් වූ “ලිබරල්” ලේබලය ප්‍රතික්ෂේප කිරීමට දැරෙන මුලුමනින් ම පාහේ විහිලු සහගත ප්‍රයත්නයක් මගිනි. එහි ප්‍රතිඵලයක් ලෙස, පක්ෂය කම්කරු පන්තියේ අව්‍යාජ ආර්ථික අවශ්‍යතාවන්ට ආයාචනා කිරීමෙහි ලා පැවති මොන යම් හෝ හැකියාවක් අහිමි කර ගෙන ඇත.

මොනවා වුවත්, සෞඛ්‍ය සේවා හා සෙසු සමාජ අවශ්‍යතා සම්බන්ධයෙන් ප්‍රතිසංස්කරන පොරොන්දු වන ඩිමොක්‍රැටික් දේශපාලනඥයන් කම්කරු පන්තිය දැනටමත් ව්‍යසනයට ලක් කොට ඇත. තමන් බලයට පත් වීමෙන් වසරක් ඇතුලත බිල් ක්ලින්ටන් සිය සෞඛ්‍ය සේවා සැලසුම් අතහැර දැමුවේ රේගන්ගේ හා ජෝෂ්ඩ් බුෂ්ගේ ආර්ථික පිලිවෙත් සාරභූත ලෙස ඉදිරියට ගෙන යන අතරතුර ය.

ඩිමොක්‍රැටික් පක්ෂය තමන්ගේ මෑත ම දේශපාලන ව්‍යසනකාරී පරාජයට ප්‍රතිචාර දක්වනු ඇත්තේ ඊටත් වඩා දකුනට ගමන් කිරීමෙනි. ඔවුන් මංමුලා සහගත ලෙස උත්සාහ කරනු ඇත්තේ බුෂ් සහ රිපබ්ලිකන්වරු සමග සම්මුති ගැසීමට, ආගමික ආයිත්තම් පැලඳ ගැනීමට සහ ස්වකීය ධනේශ්වර ප්‍රතිවාදීන්ගේ වඩා “මධ්‍යස්ථ” ප්‍රතිරූපය ලෙස තමන්ව ඉදිරිපත් කර ගැනීමට ය.

අපි ඩිමොක්‍රැටික් පක්ෂය ද ඩිමොක්‍රැටිකයන් වෙත යොමු වී සිටින “වාම” ලිබරල්වරුන් හා රැඩිකලුන් ද මැතිවරන ප්‍රතිඵල කෙරෙහි දක්වනු ඇති දිරිසුන් හා අවිවේචනාත්මක ප්‍රතිචාරයට එරෙහිව කල් තියා ම අනතුරු අඟවන අතර එම ප්‍රතිචාරය ප්‍රතික්ෂේප ද කරන්නෙමු. ඔවුන්ගේ ප්‍රතිචාරය වනු ඇත්තේ බුෂ් යලි තේරී පත්වීමට වගකිව යුත්තේ ඇමරිකානු ජනතාව වන අතර යුද්ධය හා ප්‍රතිගාමීත්වය ක්‍රියාවට දැමීමේ රිපබ්ලිකන් දක්ෂිනාංශයේ පිලිවෙත්වලට එරෙහිව කිසිවක් කල නො හැකි ය යන මතය යි.

2004 මැතිවරනයේ ප්‍රතිඵල ඇමරිකාවේ සමාජ හා දේශපාලන අර්බුදයෙහි උත්සන්න වීමක් සහ දැවැන්ත වෙනස්කම් හා අරගල පැන නැගීමක් සහතික කරයි. පවත්වා ගෙන යා නො හැකි දැවැන්ත දේශපාලන අසමතුලිතතාවක් පවතී. එය ඇමරිකානු සමාජයේ අති මහත් ආර්ථික ධ්‍රැවාන්ත ගත වීම පිලිබිඹු කරයි.

සියලු ම දේශපාලන බලතල සංකේන්ද්‍රනය වී පවත්නේ ආන්තික දක්ෂිනාංශික බලවේග අත ය. ඩිමොක්‍රැටික් පක්ෂයේ රූපාකාරයෙන් පවතින නිල විපාර්ශ්වය සිය බංකොලොත්කම ඔප්පු කර ඇත. මේ අතර ම, සමස්තයක් වසයෙන් රට තුල පවත්නේ බුෂ් පරිපාලනයට, ඉරාක යුද්ධයට සහ රිපබ්ලිකන් දක්ෂිනාංශයේ පිලිවෙත්වලට එරෙහි දැවැන්ත හා තියුනු විරුද්ධත්වයකි. අස්ථාවර හා පුපුරන සුලු තත්වයට එක් වන අනෙක් කාරනාව නම් බුෂ්ට ඡන්දය දුන් දශ ලක්ෂ සංඛ්‍යාත ජනයා රිපබ්ලිකන්වරු විසින් ගසාකනු ලැබූ භීතිය හා ව්‍යාකූලත්වය හේතු කොට ගෙන එසේ කල අතර එමගින් තමන්ගේ ම ජීවන මට්ටම්වලට තව දුරටත් වල කපනු ඇති පිලිවෙත් අඛන්ඩව ක්‍රියාවට දැමීම සහතික කල බව ය.

වෛෂයික කොන්දේසි සමාජ හා දේශපාලන අරගල පිපිරීම සඳහා ඇති තරම් ඉන්ධන සපයනු ඇත. ඉරාකයේ මඩ වගුර හා අනතුරුව පැමිනෙන අනාගත මිලිටරි මදාවිකාර ප්‍රහාර ද අයවැය හා මූල්‍ය හිඟයන් ඉහල යාමත් ඩොලරය දුර්වල වීමත් මගින් සලකුනු කෙරෙන ඇමරිකානු ධනවාදයේ ගැඹුරු වන ආර්ථික අර්බුදය ද දෙවන බුෂ් පරිපාලනයට බල කරනු ඇත්තේ බුෂ් යලි බලයට පත් කිරීමට ඡන්දය දුන් දශ ලක්ෂ සංඛ්‍යාත කම්කරුවන් ඇතුලු කම්කරු පන්තිය මත නව ප්‍රහාර දියත් කිරීමට යි.

මෙම ප්‍රහාරවලට මුහුන දිය හැක්කේ සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත කම්කරු පන්තිය දේශපාලනිකව බලමුලු ගැන්වීම මගින් ම පමනි. මෙය ඉල්ලා සිටින්නේ ඔවුන්ගේ ආගමික ආයාචනාවල කුහකත්වය හා නරුමත්වය ක්ෂමා විරහිතව එලිදරව් කිරීම ද ඇතුලුව රිපබ්ලිකන්වරුන්ගේ හා ඇමරිකානු පාලන ප්‍රභූවේ පිලිවෙත් සම්බන්ධයෙන් ක්‍රමානුකූල විරුද්ධත්වයකි.

මෙම සටනේ නායකත්වය පවත්නා ද්වි-පක්ෂ ක්‍රමයේ රාමුව තුල වර්ධනය කල නොහැකි ය. එවන් අරගලයක් ඩිමොක්‍රැටික් පක්ෂයෙන් පැහැදිලි හා ආපසු නො හැරෙන බිඳීමක් ඉල්ලා සිටී. එලඹෙන මාස ගනනාව තුල දී, මෙම මැතිවරනයේ පාඩම් උකහා ගන්නා සමාජවාදී සමානතා පක්ෂය මෙම නව මහජන සමාජවාදී ව්‍යාපාරයේ වර්ධනය සඳහා සටන් වදිනු ඇත.

© www.wsws.org